" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ISO 9001
SLAB ACCREDITED
ISO/IEC: 17021
QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/04
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2022.02. 9

**මූල්‍ය චක්‍රලේඛ 06/2022**

බස්නාහිර පළාත් සභාවේ
සියලුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් හා පුහුණු/ මූල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත අධිකාරීවල සභාපතිවරුන්,

**2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය.**

2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් 2021.12.21 දින නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ 03/2021හි උපදෙස් පහත පරිදි බස්නාහිර පළාත් සභාව වෙත අදාළ කර ගැනීම ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

02. ඒ අනුව 2022 ඇස්තමේන්තු මැයෙන් නිකුත් කළමගේ අංකCSWP/FIN-BD/01/FI/03(A) හා 2021.12.17 දිනැති ලිපියේ වියදම් පාලන විධිවිධානයන්ට අමතරව,පහත විධිවිධානයන්ද බස්නාහිර පළාත් සභා ආයතන විසින් 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු ය.

i. බස්නාහිර පළාත් සභාව විසින් ඉන්ධන දීමනා ගෙවනු ලබන ගරු පළාත් අමාත්‍යවරුන්/ පළාත් සභා ගරු මන්ත්‍රීවරුන් හා සියලු රාජ්‍ය නිලධාරීන් වෙත ගෙවනු ලබන ඉන්ධන දීමනාවෙන් මසකට ලීටර් 5ක් හෝ ඒහා සමාන මුදල් ප්‍රමාණයක් අඩු කිරීම.
ii. පළාත් සභාවේ සියලු ආයතනවල දුරකථන වියදම සියයට 25කින් අඩු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.
iii. විදුලිබල වියදම සියයට 10කින් අඩු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඒ අනුව කටයුතු කිරීම.
iv. දැනට ඉදිවෙමින් පවතින කාර්යාල ගොඩනැගිලි හැර නව කාර්යාල ඉදිකිරීම අයවැය යෝජනා මගින් යෝජිත පරිදි වසර දෙකක කාලයකට අත්හිටුවීම.

v. 2022 වර්ෂය තුළ රජයේ ආයතන සඳහා වාහන මිල දී ගැනීම අත්හිටුවීම. (එසේ වුවත් පොදු සේවාවන් හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය අත්‍යවශ්‍ය උපයෝගීතා හා ඉඩම්, වාහන මිල දී ගැනීම අවස්ථාවෝචිතව සලකා බලනු ඇත.)

vi. ආයතනයේ මනා පැවැත්ම සඳහා අත්‍යවශ්‍යවන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා හැර පළාත් සභා අරමුදලෙන් වියදම් දරන්නටවන ආයතන සඳහා නව කාර්යය මණ්ඩල බඳවා ගැනීම අත්හිටුවීම.

vii. පළාත් සභාආයතන විසින් 2022 වර්ෂය සඳහා කැලැන්ඩර්, දිනපොත්, සටහන් පොත් මුද්‍රණය නොකළ යුතු ය.

viii. නව ගොඩනැගිලි කුලියට ගැනීම නොකළ යුතු අතර ප්‍රතිපාදන නොමැතිව ලබාගන්නා ගොඩනැගිලි සඳහා කුලී ගෙවීමට පසුව අමතර ප්‍රතිපාදන ලබානොදෙනු ඇත.

ix. දේශීය අරමුදල් භාවිතා කරමින් විදේශ අධ්‍යයන චාරිකා සංවිධානය නොකළ යුතු අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් යම් නිල/ රාජ්‍යමය නිශ්චිත සහභාගීත්වයක් අත්‍යවශ්‍ය නොවන්නේ නම්, දේශීය අරමුදල් මගින් වියදම් දරමින් සම්මන්ත්‍රණ/ වැඩමුළු ආදිය සඳහා නිලධාරීන් සහභාගී නො කළ යුතු ය.

x. නිසි අධිකාරී බලයක් නොමැතිව අමාත්‍යාංශය හෝ ආයතන මට්ටමින් නිකුත් කරනු ලබන අභ්‍යන්තර උපදෙස් මත දීමනා ගෙවීම සිදු නොකළ යුතු ය.

xi. වාණිජමය ස්වරූපයේ රාජ්‍ය ආයතන ස්වකීය වියදම් පියවා ගැනීම සඳහා හැකි සෑම පියවරක්ම ගත යුතු අතර ආදායම් ඌනතාවය සලකා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාදෙන මෙන් ඉල්ලීම් නොකළ යුතු ය. අනෙකුත් ආයතන විසින් ද සලසා ඇති ප්‍රතිපාදන සීමාව මත බැඳීම් කළමනාකරණය කරගත යුතු ය.

xii. පළමු කාර්තුවේ දී පළාත් මූල්‍ය රීති 30 යටතේ ප්‍රතිපාදන මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: 01. විගණකාධිපති - කරු. දැ.ගැ.පි.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) - කරු.දැ.ගැ.පි.
03. තොරතුරු තාක්ෂණ නිලධාරී - කරු. වෙබ් අඩවියේ පල කිරීම සඳහා.